# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/6 - 2019 අප්‍රේල් මස 01 වැනි සඳුදා - 2019.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන වගන්තිය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය :* MTR/LND/ACQUI/L1/3943.
*ඉඩමේ අමාත්‍යාංශ යොමු අංකය :* 4/3/15/2011/විර්/231.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යවන පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යයතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ,මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනත්තගොඩ උතුර ගමේ කැඩැස්තර සිතියම් අංක 820010 කලාප අංක 02 පත්‍ර අංක 02 පිඹුරේ කැබලි අංක 163 වශයෙන් දැක්වෙන පහත සඳහන් ඉඩම මාතර වැවහමන්දුව 2003 ගංවතුර ව්‍යවසනයෙන් අවතැන් වූවන් සඳහා විකල්ප ඉඩම් දීමට ඉඩම් අත්කර ගෙන තිබේ.

**උපලේඛනය**

01. **කැබලි අංකය** :- **163**
*ඉඩමේ නම* :- පුවක්වත්ත හෙවත් තල්ගස්පිට්ටනිය
*ඉඩමේ විස්තරය* :- ගෙවත්ත අවුරුදු දහයක් (අවු 10 ක්) අවුරුදු විස්සක් (අවු 20 ක්) පමණ වයසැති මිශ්‍රභෝග වගාවක් ඇත.
*ඉඩමේ මුල් හිමිකම කියන්නා* :- විහාරාධිපති පූජ්‍ය හක්මණ ධම්මරතන හිමි. කොටිකාගොඩ රජමහා විහාරය. වැවහමන්දුව, මාතර.
*ඉඩමේ ප්‍රමාණය* :- හෙක්. 0.0154

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019 මැයි මස 07 වන දින පෙ.ව 10.30 ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි තව ද 2019 අප්‍රේල් මස 23 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. ඩී. කේ. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර-කඩවත්සතර.

2019 මාර්තු මස 07 වැනි දින,
මාතර-කඩවත්සතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-490


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.



1A - G 29786- 12 (2019/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.